00004

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනපති උපාධි වැඩසටහන

අවසාන පරීක්ෂණය - **2018/2019**

**ESP2319/STP9619- අධ්‍යාපනයේ මාර්ගෝපදේශය හා උපදේශනය**

කාලය - පැය තුන **(03)** යි.

---

දිනය : 2019.03.24          වේලාව : පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න තුනකට **(03)** පිළිතුරු සපයන්න.

01. (i) 'මාර්ගෝපදේශය' සහ 'උපදේශනය' යන සංකල්ප අතර ඇති සමානතා සහ වෙනස්කම් විස්තර කරන්න. (ලකුණු 09)

(ii) උපදේශකවරයෙකු විසින් සපුරාලිය යුතු වෘත්තීමය වගකීම් තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iii) පෙර ජීවත් වූ පුද්ගලයන්ට වඩා වර්තමාන සමාජ සන්දර්භය තුළ ජීවත්වන පුද්ගලයන් සඳහා මාර්ගෝපදේශය සහ උපදේශන සේවාව වඩා අවශ්‍ය වේ.

මෙම වගන්තිය උදාහරණ තුනක් **(03)** ඇසුරින් සනාථ කරන්න. (ලකුණු 12)

02. (i) ඵලදායී වෘත්තීය උපදේශනයක් සඳහා අවශ්‍ය වන පුද්ගල සහ කණ්ඩායම් උපදේශන කුසලතා තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 09)

(ii) වෘත්තීය සංවර්ධන ක්‍රියාවලිය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) සේවාලාභීන්ට ඔවුන්ගේ වෘත්තීමය ඉලක්ක පැහැදිලි කර ගැනීමට උපකාර කිරීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියා හතරක් **(04)** විස්තර කරන්න.

(ලකුණු 16)

03. (i) උපදේශකවරයෙකුට උපදේශන ක්‍රම ශිල්පවල ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) බොහොමයක් ක්‍රම ශිල්ප න්‍යායයන් මත පදනම් ව ඇත.

(අ) ඕනෑම උපදේශන න්‍යායයක් තෝරාගෙන එහි මූලික මූලධර්ම පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ආ) තෝරාගත් න්‍යායය උපදේශනයේ යොදාගත හැකි අවස්ථා/සේවාලාභීන් වර්ග විස්තර කරන්න. (ලකුණු 07)

(ඇ) තෝරාගත් න්‍යායයේ ඇති සීමාවන් දෙකක් **(02)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

04. (i) උපදේශකවරයෙකුගේ ලක්ෂණ හතරක් **(04)** විස්තර කරන්න. (ලකුණු 08)

(ii) පාසල් පරිසරය තුළ සිසුන් මානසික ආතතිකාරී තත්ත්වයන්ට යොමු කරන අවස්ථා හතරක් **(04)** පැහැදිලි කරන්න. (ලකුණු 17)

(iii) ඉහත සඳහන් කළ තත්ත්වයන් අවම කිරීම සඳහා උපදේශකවරයෙකුට ගත හැකි ක්‍රියාමාර්ග හතරක් **(04)** සාකච්ඡා කරන්න. (ලකුණු 08)

05. (i) 'විශේෂ අධ්‍යාපන අවශ්‍යතා' යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 09)

(ii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් ලෙස සැලකිය හැකි සිසුන් වර්ග හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 12)

(iii) ඔබ ඉහත සඳහන් කළ එක් සිසුන් වර්ගයක් තෝරාගෙන එම සිසුන්ට සහායවීම සඳහා උපදේශකවරයෙකුට අනුගමනය කළ හැකි උපාය මාර්ග හතරක් **(04)** පැහැදිලි කරන්න. (ලකුණු 12)

06. (i) මාර්ගෝපදේශය සහ උපදේශනයේ සේවාවන් සැපයෙන ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් **(03)** උදාහරණ සමඟ විස්තර කරන්න. (ලකුණු 09)

(ii) පහත සඳහන් අවශ්‍යතා සපුරාලීමේ දී විශ්වවිද්‍යාලයක/උසස් අධ්‍යාපන ආයතනයක සිටින ගුරුවරයෙකුගේ උපදේශකවරයෙකු ලෙස ඇති කාර්යභාරය පැහැදිලි කරන්න.

(අ) පද්ධතියේ අභ්‍යන්තර කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට.(ලකුණු 08)

(ආ) විශ්වවිද්‍යාලය/උසස් අධ්‍යාපන ආයතනය තුළ ඇති සමාජ විරෝධී ක්‍රියා අවම කිරීමට (ලකුණු 08)

(ඇ) ඉගෙනුම ලබන්නන්ගේ වෘත්තීමය සහ රැකියා අපේක්ෂාවන් සපුරාගැනීමට උපකාර කිරීමට.

(ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.